# වාර්ෂික වාර්තාව 2019

**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ**
**කොමිෂන් සභාව,**
**ශ්‍රී ලංකාව.**

2020 මාර්තු

# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව, ශ්‍රී ලංකාව.

# වාර්ෂික වාර්තාව 2019

**කාර්යාලය :**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව,

බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය (BMICH) ,

කාමර අංක 202-203, දෙවන ගොඩනැගිල්ල, කොළඹ 07,

ශ්‍රී ලංකාව.

දුර. : +94 011 2691625

ෆැක්ස් : +94 11 2691625

විද්‍යුත් ලිපිනය : rti.commission16@gmail.com

# පටුන

**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි**

**දැක්ම, මෙහෙවර සහ අරමුණු**

**සභාපතිතුමාගේ පෙරවදන**

**1.** තොරතුරුවලට ප්‍රවිශ්ටවීම සම්බන්ධයෙන් පුරවැසියන් සතු අයිතිවාසිකම

**2. කොමිෂන් සභාවේ කාර්ය, කර්තව්‍යයන් සහ බලතල**

**3. කොමිෂන් සභාවේ කාර්ය සාධනය**

3.1. අභියාචනා බාරගැනීම

3.2. අභියාචනා විභාගය

3.3. අභියාචනා ස්වරූපය

3.4. පොදු අධිකාරීන්ගේ අනුකූලතාවය

3.5 පොදු අධිකාරීන් විසින් වාර්තා කිරීම

3.6 මහජන දැනුවත්භාවය උදෙසා වැඩසටහන්

**4. පරිපාලනය සහ මූල්‍ය කාර්යසාධනය**

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

### දැක්ම

ශ්‍රී ලාංකේය පුරවැසියන්ට ඔවුන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ඵලදායී ලෙස ක්‍රියාත්මක කරගත හැකි බව සාක්ෂාත් කිරීම.

### මෙහෙවර

සියලු ශ්‍රී ලාංකේය පුරවැසියන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිය සංවර්ධනය කරමින් සහ සුරක්ෂණය කරමින්, ඵලදායී විනිශ්චයකිරීම් සහ සියලු පොදු අධිකාරීන්ගේ භාවිතාවන් අධීක්ෂණය හරහා විනිවිදභාවයේ සහ යහපාලනයේ සංස්කෘතියක් අනුදකිමින් තමන්ට අදාළ සියලු තොරතුරු පිළිබඳ පුරවැසියන් වඩාත් සාවධානී කිරීමට මගපෙන්වමින් ප්‍රගාමී ලෙස හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීම.

### අරමුණු

- <u>තොරතුරු ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා වන පියවර ප්‍රවර්ධනය කිරීම</u>: අභියාචනා සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කිරීමේ ක්‍රමවේදය හා සම්බන්ධ රීති, තොරතුරු ලබාදීම සඳහා ගාස්තු සහ වාර්තා ආකෘති සකස් කිරීම, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක භාවයට පත්කිරීමේ අරමුණින් මාර්ගෝපදේශන සහ නියාමන ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රකාශනය කිරීම, ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් යෝජනා කරන රෙගුලාසි සම්බන්ධව උපදේශනය සහ කොමිෂන් සභාවේ අභිප්‍රේක්ෂණ සහ විනිශ්චයික කාර්යභාරය ප්‍රසිද්ධ කිරීම.

- <u>වඩා ඵලදායි විනිශ්චයන් සැපයීම සහ ඒවා බලාත්මක කිරීම</u>: පොදු අධිකාරීන් සහ තොරතුරු පතන්නන් අතර ඇතිවන ගැටුම් ඵලදායී ලෙස විනිශ්චය කිරීම.

- <u>රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම සඳහා සහාය දැක්වීම</u>: රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීමේදී සහයෝගයෙන් කටයුතු කිරීම, උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ විශේෂිත පුහුණුව සඳහා සහාය දැක්වීම.

- <u>මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම</u>: කොමිෂන් සභා වෙබ් අඩවිය සහ මාධ්‍ය අන්තර්ක්‍රියා හරහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් මහජනතාවගේ අවබෝධය ඉහළ නැංවීම.

- <u>වාර්තා කළමනාකරණය වැඩිදියුණු කිරීම:</u> මාර්ගෝපදේශන ලබාදීම මඟින්, තොරතුරු කළමනාකරණය සම්බන්ධයෙන් නිශ්චිත උපදෙස් ලබා දීම.

- <u>ප්‍රගාමී ලෙස හෙළිදරව් කිරීම ඉහළ නැංවීම:</u> මාර්ගෝපදේශ නිකුත් කිරීම, අවම ප්‍රමිතීන් දැක්වීම, දැනට පවත්නා නීතිවල සංශෝධනවලට මුලපිරීම සහ කාලාන්තරික අගැයීම් සිදුකිරීම.

- <u>ඵලදායී අධීක්ෂණ සහ ඇගයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම:</u> උචිත ඔන්ලයින් විසඳුම් සහ අගැයීම් මෙවලම් උපයෝගීකර ගැනීම හරහා, පොදු අධිකාරීන් විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාවට නංවන ආකාරය ඵලදායී ලෙස අධීක්ෂණය සහ ඇගයීම.

# සභාපතිතුමන්ගේ පෙරවදන

මෙම වාර්තාව මගින් සංක්ෂිප්තයක් වශයෙන් 2019 වර්ෂය තුල තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි (RTIC) කාර්ය සාධනය ඉදිරිපත් කෙරේ. එමගින් කොමිෂන් සභාවෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්, එනම්, තොරතුරු නිලධාරීන්ගේ සහ පොදු අධිකාරීන්හි නම්කළ නිලධාරීන් වශයෙන් වගකීම් දරණ නිලධාරීන්ගේ තීරණ වලට එදිරිව තොරතුරු ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් නෛතික පියවර ගැනීම සිදු කරනු ලබයි. තවද, තොරතුරු අයිතිවාසිකම පිළිබඳව සහ ඒ සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනයන්හි අනුගතභාවය මෙන්ම වාර්තා කිරීමේ මට්ටම සම්බන්ධයෙන් මහජනතාව තුල දැනුම්වත්භාවය ගොඩනැංවීමෙහිලා සාක්ෂාත් කරගත් ඉලක්කයන් සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් වේ.

සමාලෝචිත වර්ෂය තුල දී තොරතුරු අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත මහජන පැමිණිලි 1089ක් ලැබුණු අතර ඉන් පැමිණිලි 709ක් (නැතිනම් සියයට 65.1ක්) සම්බන්ධයෙන් කටයුතු කොට අවසන් කරන ලදී. විශේෂයෙන්ම නෛතික කටයුතු කිරීම සඳහා නිපුනතා සපුරන ලද නිලධාරීන් හිඟව සිටින සුළු කාර්ය මණ්ඩලයක් සහිත අභියාචනා විභාග කරන ආයතනයක් සම්බන්ධයෙන් ගත් කළ සියයට 65ක සාර්ථකත්වයක් අත් කර ගැනීම සුවිශේෂී සාර්ථකත්වයකි. කොමිෂන් සභාව විසින් මෙබඳු අභියෝග ජය ගැනීමෙහිලා සාර්ථක වීමට හේතු පාදක වූයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), මෙන්ම ඇමරිකානු ආධාර ලද තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ වැඩසටහන (SDGAP-USAID) මගින් ලද නෛතික උපදේශකත්වය සහ නෛතික පර්යේෂකයන්ගේ සහාය බව කිව මනාය. එබැවින්, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), මෙන්ම ඇමරිකානු ආධාර ලද තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ වැඩසටහන (SDGAP-USAID)වෙත සහ අන් සියලු උපදේශකයන් වෙත ඔවුන්ගේ අද්විතීය දායකත්වය සම්බන්ධයෙන් කෘතඥ පූර්වක වීමට මෙය අවස්ථාව කොට ගනිමි.

ස්විස්ටර්ලන්ත තානාපති කාර්යාලයෙන් ලද මූල්‍ය සහාය සමඟ, සිවිල් සමාජ සංවිධාන, ප්‍රජා පාදක සංවිධානයන්හි (CBOs) සාමාජිකයන් සහ රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් යුතුව, පානම (අම්පාර), අඹගමුව (නුවරඑළිය), කිලිනොච්චි, යාපනය, කරුවලගස්වැව (පුත්තලම), සූරියවැව (හම්බන්තොට) සහ මහියංගනය (බදුල්ල) වැනි පිටිසරබද දිස්ත්‍රික්කයන්හි මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනෙහි කොටසක් වශයෙන් පලාත් උපදේශන සහ අභියාචනා විභාග කිරීමේ වැඩමුළු 7ක් කොමිෂන් සභාව විසින් සිදු කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුලදී ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ සහාය සහිතව විශේෂඥ නීති විශාරදයින්, සංස්කාරකයින්, රජයේ නිලධාරීන් සහ ප්‍රතිපත්ති සම්පාදනයෙහි ප්‍රවීනයන් විසින් දායකත්වය සපයන ලදුව සහ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි කොමසාරිස් කිෂාලි පින්ටෝ - ජයවර්ධනයන් විසින් සංස්කරණය කරන ලද්දා වූ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි තෝරාගත් නියෝග සහ ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය හා ක්‍රමවේදය පිළිබඳ ප්‍රත්‍යාවලෝකනය වශයෙන් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම සම්බන්ධයෙන් වූ ප්‍රකාශන දෙකක් එළි

දැක්වීමට හැකියාව ලැබිණ. මේ සම්බන්ධයෙන් ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයෙන් ලද නොමසුරු සහාය වෙනුවෙන් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි කෘතඥතාව පළ කෙරේ.

2019 සැප්තැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි සහාය යටතේ සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් සහ පලාත් සභාවන්හි ප්‍රධාන ලේකම්වරුන් සඳහා සම්මන්ත්‍රණයක් පැවැත්වුණු අතර ඇමරිකානු ආධාර යටතේ පවත්නා තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ වැඩසටහන (SDGAP-USAID) හරහා සමාලෝචිත වර්ෂයේ දී කොමිෂන් සභාවෙහි ධාරිතාව නැංවීම උදෙසා වෙබ් පාදක නියාමන පද්ධතියක් සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භකරන ලදී.

මෙම අවස්ථාවේදී අභියාචනා විභාග පවත්වමින් ද ඒවා පසිදලමින්ද වෙහෙසකර කටයුත්තක නියැලෙමින් පැය ගණන් කැපකරන කොමිෂන් සභාවෙහි සාමාජිකයන්ට ස්තුතිවන්ත වීමට මෙය අවස්ථාව කොට ගනිමි. මහජනතාව දැනුම්වත් කරලීමෙහි ලා ඔවුන්ගේ දායකත්වයද ප්‍රසංශනීය වේ. තවද, කාර්ය මණ්ඩල සහ මූල්‍ය අසීරුතා මධ්‍යයේ වුවද ඉලක්ක සපුරාලීම සඳහා වෙහෙස වන අධ්‍යක්ෂ ජනරාල්තුමන් මෙන්ම කාර්ය මණ්ඩලයේ අන් සියලු සාමාජිකයන් වෙත මාගේ ස්තුතිය පිරිනමමි.

මහින්ද ගම්මම්පිල,
සභාපති.

# 1. තොරතුරු වලට ප්‍රවිශ්ට වීම සම්බන්ධයෙන් පුරවැසියන් සතු අයිතිවාසිකම

## 1.1 තොරුතුරු දැන ගැනීම සඳහා ඇති අයිතිවාසිකම – මූලික අයිතිවාසිකමකි

2015 වර්ෂයේදී පනවනු ලැබීමට යෙදුණු ශ්‍රී ලංකා අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය මගින් තොරතුරුවලට ප්‍රවිශ්ය වීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස ආරක්ෂා කර ඇත්තේය. එහි 14 (1) වගන්තිය මගින් සඳහන් කරනු ලබන්නේ; '(අ) රජය, අමාත්‍යාංශයක් හෝ යම් රජයේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ යම් නීතියක් මගින් හෝ යටතේ පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් සතුව පවත්නාවූ, (ආ) යම් පලාත් අමාත්‍ය මණ්ඩලයක අමාත්‍යවරයෙකුගේ යම් අමාත්‍යාංශයක් හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පලාත් සභා ප්‍රඥප්තියක් මගින් පිහිටුවන ලද්දා වූ හෝ ස්ථාපිත කරන ලද්දා වූ හෝ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් සතුව පවත්නා වූ ද, (ඇ) මේ උප ව්‍යවස්ථාවේ (අ), (ආ), හෝ (ඇ), ඡේදයන්හි සඳහන් ආයතන වලට අදාලව වෙනත් යම් තැනැත්තකු සතුව පවත්නා වූ මෙන්ම පුරවැසියකුගේ අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආරක්ෂා කිරීම සඳහා හෝ ආරක්ෂා කිරීම සඳහා හෝ අවශ්‍ය වූ යම් තොරතුරක් වෙත නීතියෙන් ප්‍රතිපාදනය කොට ඇති පරිදි ප්‍රවේශ වීමේ අයිතිවාසිකම සෑම පුරවැසියකු සතුවම පවත්නා බව' ය.

තවද, එහි (2) වන උප වගන්තියෙන් ස්ථාපිත කොට ඇත්තේ, 'ජාතික ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාව හෝ මහජන ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ද, විෂමාචාර හෝ අපරාධ වැළැක්වීම පිණිස ද, සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිස ද, පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම පිණිස ද, අධිකරණයට අපහාස කිරීම වැළැක්වීම පිණිස ද, පාර්ලිමේන්තු වරප්‍රසාද ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ද විශ්වාසය මත දැනුම් දෙන ලද තොරතුරු හෙළිදරව් කිරීම වැළැක්වීම පිණිස ද එසේ නොමැති නම් අධිකාරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාම පිණිස ද, ප්‍රජාතාන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය වන්නා වූ නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හැර වෙනත් කවර හෝ සීමා කිරීමක් මෙම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති අයිතිවාසිකම මත නොපැණවිය යුත්තේය' යනුවෙනි.

## 1.2 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත

ශ්‍රී ලංකා පාර්ලිමෙන්තුව 2016 අගෝස්තු මස 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්මත කරනු ලැබුවේ තොරතුරු වෙත ප්‍රවිශ්ය වීමේ අයිතිවාසිකම ලබා දීමට, තොරතුරු ප්‍රතික්ෂේප කළ හැකි පදනම නියම කිරීමට, තොරතුරු කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීමට, තොරතුරු නිලධරයන් පත් කිරීමට, ඒ හා සබැඳි හෝ ආනුෂංගික කාර්ය පටිපාටීන් සහ ආකෘති සකස් කිරීම පිණිසයි.

.

## 1.3 තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව (RTIC)

මෙයට අනුව 2016 ඔක්තෝබර් 01 වන දින පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාරව තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ස්ථාපිත කරනු ලැබුවේ නිත්‍ය අනුප්‍රාප්තිකත්වය සහ පොදු මුද්‍රාවක් සමඟිනි. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව එනම් පනත යටතේ පිහිටුවනු ලැබූ ප්‍රධාන අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අධිකාරිය වන අතර, එමඟින් පනතට බලාත්මකභාවය ලබාදීම සහ එහි විධිවිධාන බලාත්මක කිරීම සිදු කෙරේ. තොරතුරු අයිතිවාසිකමෙහි කාර්ය පටිපාටි වලට සම්බන්ධ රීති හා රෙගුලාසි සකස් කිරීම සඳහා එයට බලය ලබා දී ඇත. 38 වන වගන්තිය යටතේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරන තැනැත්තන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමටත් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමටත් කොමිෂන් සභාවට හැකියාව තිබේ. 2017 පෙබරවාරි 03 වන දින පටන් සියලු පොදු අධිකාරීන් / රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් පනත ක්‍රියාත්මක වේ.

තොරුතුරු දැන ගැනීමේ කොමිෂන් සභාව ව්‍යවස්ථාදායක සභාව විසින් නිර්දේශ කරන ලද්දා වූ ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන්නා වූ සභාපතිවරයකුගෙන් සහ කොමසාරිස්වරුන් සිව් දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වන්නා වූ ව්‍යවස්ථාපිත ආයතනයකි. සාමාජිකයන් නිර්දේශ කිරීමේ දී, ව්‍යවස්ථාදායක සභාව විසින් ශ්‍රී ලංකා නීතිවේදීන්ගේ සංගමය, ප්‍රකාශකයින්ගේ සංවිධානය, සංස්කාරක සහ ජන මාධ්‍ය සංසදය සහ අනෙකුත් සිවිල් සමාජයීය සංවිධානයන්හි නාම යෝජිත පුද්ගලයන් අතරින් කොමිෂන් සභාවේ සාමාජිකයන් තෝරා ගනු ලැබේ. කෙසේ වතුදු, එසේ කොමිෂන් සභාව විසින් තෝරා ගනු ලබන පුද්ගලයින් සිය සමාජීය ජීවිතයෙහි අද්විතීය දැනුම, අත්දැකීම් සහ නෛතික පාලන ක්ෂේත්‍රයෙහි, රාජ්‍ය පරිපාලනයෙහි, සමාජ සේවාවන්හි, ජන මාධ්‍යවේදයෙහි, විද්‍යාවෙහි මෙන්ම තාක්ෂණික හෝ කලමනාකරණයෙහි විශිෂ්ටත්වය පෙන්නුම් කළ අය විය යුතු අතර කිසිදු දේශපාලන පක්ෂයකට නොබැඳුණු එමෙන්ම කිසිදු රාජ්‍ය, නෛතික හෝ වෙනත් කිසිදු කාර්යාලයක නියැලීමකින් තොර තවද කිසිදු ව්‍යාපාරයක හෝ වෘත්තියක නියැලී නොසිටින්නවුන් විය යුතුය.

### 1.4 රෙගුලාසි, රීති සහ මාර්ගෝපදේශ

ප්‍රායෝගිකව මෙම නීතිය යොදා ගැනීමේදී, කොමිෂන් සභාව විසින් ගාස්තු සහ අභියාචනා සම්බන්ධයෙන් වන රීති ගැසට් කොට ඇති අතර, පොදු අධිකාරීන් සමඟ සහයෝගයෙන් යුතුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳව රෙගුලාසි සකස් කිරීමට කටයුතු කරමින් රාජ්‍ය ආයතනයන් සඳහා ප්‍රගාමී තොරතුරු අනාවරණය කිරීම සම්බන්ධයෙන් වන උපදෙස් මාලා සම්පූර්ණයෙන් සකස් කරන ලදී. 41වන වගන්තිය ප්‍රකාරව, තොරතුරු වලට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් වන රෙගුලාසි, ප්‍රගාමී තොරතුරු අනාවරණය, ඉල්ලීම් සඳහා වන ආකෘතිපත්‍ර, පවරන ලද නිලධාරීන් සහ කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ පටිපාටිය මෙන්ම තොරතුරු

දැන ගැනීම පිළිබඳ අයිතිවාසිකම, ගාස්තු, නොමිලයේ නිකුත් කරනු ලබන තොරතුරු, අභියාචනා විමර්ශන පටිපාටිය ආදිය; 2017 පෙබරවාරි 03වන දින අමාත්‍යවරයා විසින් පළ කරන ලද 2004 / 66 දරණ අති විශේෂ ගැසට් නිවේදනයෙහි ප්‍රකාශයට පත් කරන ලදී. මෙකී රීතීන් 2019ක් වූ පෙබරවාරි මස 17 වන දින අති විශේෂ ගැසට් නිවේදන අංක 2006 / 43 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධනයට ලක් කරන ලදී. පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් සිය වාර්ෂික වාර්තා තොරතුරු දැන ගැනීම පිළිබඳ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර පනතේ 8 සහ 9 යන වගන්ති ප්‍රකාරව අමාත්‍යවරුන් විසින් අර්ධ වාර්ෂික /වාර්තා ප්‍රකාශයට පත් කිරීම අපේක්ෂා කෙරේ.

## 1.5 2017 – 2019 ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීමේ සැලැස්ම

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) සහයෝගීතාව සහිතව අරමුණු 8ක් පෙරදැරි කර ගනිමින් සිය ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීමේ තුන් අවුරුදු සැලසුම පිළියෙල කරන ලදී.

## 1.6 වර්තමාන කොමිෂන් සභාව

සභාපති

දොන් මහින්ද ගම්මම්පිල, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පංතියේ (විශේෂ ශ්‍රේණි) විශ්‍රාමලත් නිලධාරියෙකි. හිටපු අමාත්‍යාංශ ලේකම්වරයෙකි.

කොමසාරිස්වරු

ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ - ජයවර්ධන

ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා

විනිසුරු, හිටපු සභාපති, අභියාචනාධිකරණය, රෝහිනී වල්ගම සහ,

ජ්‍යෙෂ්ඨ පර්යේෂක ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්

# 2. කොමිෂන් සභාවේ කාර්යය, කර්තව්‍යයන් සහ බලතල

**2.1පනතෙහි 14 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්යය සහ කර්තව්‍යයන් පහත පරිදි වේ.**

අ) තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ පොදු අධිකාරීන් / රාජ්‍ය ආයතන වලට පවරා ඇති කාර්යයන් නිසි ලෙස ඉටු කරන්නේද යන්නත් පනතට අනුකූලව කටයුතු කරන්නේද යන්නත් අධීක්ෂණය කිරීම

ආ) ප්‍රතිසංස්කරණ සහ සමාලෝචන සඳහා සාමාන්‍ය නිර්දේශ නිකුත් කිරීම සහ යම් රාජ්‍ය ආයතනයක් සම්බන්ධයෙන් විශේෂයෙන් යොමු කරන ලද නිර්දේශ නිකුත් කිරීම

ඇ) මෙම පනත යටතේ ඕනෑම තොරතුරක් නිදහස් කිරීම සඳහා රාජ්‍ය ආයතන විසින් අයකළ යුතු ගාස්තු තීරණය කිරීම සඳහා අවශ්‍ය වන උපදෙස් මාලා නිකුත් කිරීම

ඈ) තොරතුරු නිලධාරියකු විසින් තොරතුරු නොමිලේ නිකුත් කළ හැකි අවස්ථා නියම කිරීම

ඉ) ප්‍රගාමී තොරතුරු නිරාවරණය යන මූලධර්මය පදනම් කර ගනිමින් මිල ලේඛනය නියම කිරීම

ඊ) පනතෙහි ප්‍රතිපාදන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් සඳහා වන පුහුණු අවස්ථා සමඟ සම්බන්ධ වීම හෝ පුහුණු අවස්ථා භාර ගැනීම

උ) මෙම පනතෙහි අවශ්‍යතා ප්‍රකාශයට පත් කිරීම සහ පනත යටතේ පුද්ගල හිමිකම් ප්‍රකාශයට පත් කිරීම; සහ

ඌ) රාජ්‍ය ආයතන / පොදු අධිකාරීන් සඳහා නිසි වාර්තාකරණ කලමනාකරණයක් සකස් කර ගැනීම සඳහා වන උපදෙස් මාලා නිකුත් කිරීම

**2.2. පනතෙහි 15 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවෙහි බලතල**

අ) පැමිණිලි විභාග කිරීමට සහ කොමිසම ඉදිරියට ඕනෑම පුද්ගලයකුට පැමිණීමට හැකි පරිදි කටයුතු සැලැස්වීම;

ආ) එවැනි පුද්ගලයන් පරීක්ෂා කිරීම සහ එකී පුද්ගලයා සතුව පවත්නා තොරතුරු ලබා දීම;

ඇ) පොදු ආයතනයක පවත්නා ඕනෑම තොරතුරක් පරීක්ෂා කිරීම;

ඈ) යම් ආකාරයකට තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා පොදු ආයතනයකට විධාන කිරීම;

ඉ) යම් පොදු ආයතනයක් විසින් රඳවාගෙන පැවති තොරතුරු ප්‍රකාශයට පත් කිරීම සඳහා එකී පොදු ආයතනයකට විධානය කිරීම;

ඊ) 32 වන වගන්තිය යටතේ යම් අගතියට පත් වූ පාර්ශවයක් විසින් සිදු කරන ලද අභියාචනයක් විභාග කිරීම සහ තීරණය කිරීම;

උ) යම් තොරතුරක් නියමිත වේලාවට නොලැබිනැ යි කරන ලද චෝදනාවකදී යම් පුරවැසියකුගෙන් අය කරන ලද යම් මුදලක් වේ නම් එය ප්‍රතිපූර්ණය කිරීමට විධානය කිරීම;

ඌ) පනතේ අංක 41 දරණ වගන්තිය ප්‍රකාරව ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යවරයා විසින් පනවනු ඇති රෙගුලාසි සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම; සහ

එ) පනතේ අංක 42 දරණ වගන්තියෙහි දක්වන ලද කරුණු සම්බන්ධයෙන් රීති සකස් කිරිම.

**2.3 කොමිෂන් සභාවේ රාජකාරි සහ ක්‍රියාකාරකම් යටතේ පහත දැක්වෙන සවිස්තරාත්මක ක්‍රියාකාරකම් එයට පැවරී ඇත.**

**අ)** තොරතුරු නිලධාරීන් (පනතේ අංක 5 (5) දරණ වගන්තිය) වෙත අණාවරණය වන තොරතුරු වලට පරිබාහිරව පවත්නා වූ ඕනෑම තොරතුරක් වෙත ප්‍රවේශ වීමේ හිමිකම සම්බන්ධයෙන් පවත්නා වූ යම් ගැටළුවක් සම්බන්ධයෙන් කරන ලද උපදෙස් පැතීමක් සඳහා අවශ්‍ය මගපෙන්වීම ලබා දීම;

**ආ)** රජයේ ආයතනයන් විසින් කලමනාකරණය කරගෙන යනු ලබන වාර්තා ලබා ගැනීම සඳහා පවත්නා බාදාවන් සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම (පනතේ අංක 7(2) දරණ වගන්තිය)

**ඇ)** අමාත්‍යංශ විසින් ප්‍රකාශයට පත් කරනු ලබන අර්ධ වාර්ෂික වාර්තා සකස් කිරීමෙහි ලා අවශ්‍ය වන ආකෘතිය තීරණය කිරීම (පනතෙහි අංක 8(1) දරණ වගන්තිය);

**ඈ)** තීරණය කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් මහජනතාව මෙන්ම ව්‍යාපෘතිය නිසා බලපෑමට ලක් වූ අනෙකුත් පාර්ශවයන් වෙත සමස්තයක් ලෙස ප්‍රගාමී තොරතුරු සන්නිවේදනය කිරීමෙහිලා අදාල වන්නා වූ උපදෙස් නිකුත් කිරීම (පනතෙහි අංක 9(1) දරණ වගන්තිය);

**ඉ)** සෑම රජයේ ආයතනයක් විසින්ම වාර්ෂිකව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර මහජනතාව වෙත සිය කාර්යාලයන් හි සහ ඔවුන්ගේ අදාල වෙබ් අඩවි වල ප්‍රදර්ශනය කළ යුතු වන්නා වූ වාර්ෂික වාර්තාවන් හි ආකෘති වලට සම්බන්ධ නීති සම්පාදනය කිරීම

**ඊ)** කොමිෂන් සභාවට අවශ්‍ය වන්නේ යැයි සැලකෙන පරිදි (පනතෙහි අංක 13 දරණ වගන්තිය) සේවකයන් පත් කිරීම

**උ)** කොමිෂන් සභාවෙහි අරමුදල සහ එහි ගිණුම් පවත්වාගෙන යාම

**ඌ)** පනතෙහි 32 වන වගන්තිය ප්‍රකාරව අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා කාර්ය පටිපාටික අවශ්‍යතා ප්‍රකාශයට පත් කිරීම (පනතෙහි අංක 22 දරණ වගන්තිය)

**එ)** පොදු යහපත් සඳහා යම් ආයතනයක පවත්නා තොරතුරු මුදාහැරීම සිදු කරනු ලබන පොදු ආයතනයකට තෙවන පාර්ශවයක් විසින් සපයනු ලබන එවැනි තොරතුරු නිරාවරණය කිරීම සඳහා පොදු අධිකාරීන්ට නියමකිරීම (පනතෙහි අංක 22 (2) (ඇ) දරණ වගන්තිය); සහ,

**ඒ)** තොරතුරු නිලධාරීන් / පත් කරන ලද නිලධාරීන් විසින් (පනතෙහි අංක 39 (4) දරණ වගන්තිය) සිදු කරනු ලබන වැරදි සම්බන්ධයෙන් නඩු පැනවීමේ කටයුතු සිදු කිරීම

# 3. කොමිෂන් සභාවෙහි කාර්යසාධනය

### 3.1 අභියාචනා ලැබීම

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුලදී කොමිෂන් සභාව වෙත අභියාචනා 1089ක් ලද අතර එය පූර්ව වර්ෂයෙහි ලද අභියාචනා 800 සමඟ සංසන්දනය කිරීමේදී සැලකිය යුතු වර්ධනයකි. වර්ෂයේ මාස අනුව ලද අභියාචනා සංඛ්‍යාව වගුව - 1 මගින් පෙන්නුම් කරයි.

වගුව - 1 2018 සහ 2019 වර්ෂයන් හි දී මාස අනුව ලද අභියාචනා සංඛ්‍යාව

| මාසය | 2018 | 2019 |
|---|---|---|
| ජනවාරි | 60 | 114 |
| පෙබරවාරි | 67 | 96 |
| මාර්තු | 69 | 84 |
| අප්‍රේල් | 76 | 95 |
| මැයි | 72 | 55 |
| ජූනි | 41 | 74 |
| ජූලි | 78 | 106 |
| අගෝස්තු | 91 | 92 |
| සැප්තැම්බර් | 95 | 102 |
| ඔක්තෝබර් | 73 | 84 |
| නොවැම්බර් | 61 | 103 |
| දෙසැම්බර් | 30 | 84 |
| එකතුව | 800 | 1089 |

වගුව **- 2 මගින් පෙන්නුම් කරන්නේ 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂය තුලදී පලාත් මට්ටමින් ලද අභියාචනා සංඛ්‍යාවයි. මධ්‍යම සහ උතුරු මැද පලාත් වල අභියාචනා සංඛ්‍යාවේ අඩු වීමක් පෙන්නුම් කෙරේ.**

වගුව - 2 2019 වර්ෂය තුලදී පලාත් මට්ටමින් ලද අභියාචනා සංඛ්‍යාව

| පලාත | 2018 | 2019 | % ප්‍රතිශතාත්මක වෙනස |
|---|---|---|---|
| බස්නාහිර | 338 | 443 | 31.1 |
| දකුණ | 143 | 188 | 31.5 |
| උතුර | 48 | 69 | 43.8 |
| මධ්‍යම | 77 | 74 | -3.9 |
| සබරගමුව | 35 | 64 | 82.9 |
| උතුරු මැද | 43 | 30 | -30.2 |
| නැගෙනහිර | 75 | 113 | 50.7 |
| ඌව | 15 | 31 | 106.7 |
| වයඹ | 26 | 77 | 196.2 |
| එකතුව | 800 | 1089 | 36.1 |

වගුව - 3 මගින් පෙන්නුම් කරනුයේ 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී කොමිෂන් සභාව විසින් ලද අභියාචනා සංඛ්‍යාවෙහි පලාත් අනුව බෙදීයාමයි. ඉහලම සංඛ්‍යාව බස්නාහිර පලාතෙන් ලද අතර අඩුම සංඛ්‍යාව උතුරු මැද පලාතෙන් ලැබී ඇත.

වගුව - 3 2018 සහ 2019 වර්ෂයන්හි දී කොමිෂන් සභාව විසින් ලද අභියාචනා ප්‍රමාණයෙහි පලාත් අනුව බෙදීයාම

| පලාත | 2018 | % කොටස | 2019 | % කොටස |
|---|---|---|---|---|
| බස්නාහිර | 338 | 42.3 | 443 | 40.7 |
| දකුණ | 143 | 17.9 | 188 | 17.3 |
| උතුර | 48 | 6.0 | 69 | 6.3 |
| මධ්‍යම | 77 | 9.6 | 74 | 6.8 |
| සබරගමුව | 35 | 4.4 | 64 | 5.9 |
| උතුරු මැද | 43 | 5.4 | 30 | 2.8 |
| නැගෙනහිර | 75 | 9.4 | 113 | 10.4 |
| ඌව | 15 | 1.9 | 31 | 2.8 |
| වයඹ | 26 | 3.3 | 77 | 7.1 |
| එකතුව | 800 | 100.0 | 1089 | 100.0 |

වගුව - 4 දිස්ත්‍රික්ක අනුව අභියාචනා ලැබීම බෙදීයාම

| දිස්ත්‍රික්කය | 2018 | % කොටස | 2019 | % කොටස |
|---|---|---|---|---|
| කොළඹ | 213 | 26.5 | 323 | 29.7 |
| ගම්පහ | 91 | 11.3 | 73 | 6.7 |
| කළුතර | 35 | 4.4 | 47 | 4.3 |
| ගාල්ල | 90 | 11.2 | 113 | 10.4 |
| මාතර | 21 | 2.6 | 44 | 4.0 |
| හම්බන්තොට | 32 | 4 | 31 | 2.8 |
| මහනුවර | 63 | 7.8 | 49 | 4.5 |
| මාතලේ | 13 | 1.6 | 12 | 1.1 |
| නුවරඑළිය | 2 | 0.2 | 13 | 1.2 |
| ත්‍රිකුණාමලය | 6 | 0.7 | 12 | 1.1 |
| මඩකලපුව | 7 | 0.9 | 25 | 2.3 |
| අම්පාර | 61 | 7.7 | 76 | 7.0 |
| යාපනය | 26 | 3.4 | 49 | 4.5 |
| වව්නියාව | 15 | 1.9 | 10 | 0.9 |
| මන්නාරම | 5 | 0.6 | 2 | 0.2 |
| කිලිනොච්චි | 1 | 0.1 | 5 | 0.5 |
| මුලතිවු | 1 | 0.1 | 3 | 0.3 |
| කුරුණෑගල | 189 | 2.4 | 54 | 5.0 |
| පුත්තලම | 7 | 0.9 | 23 | 2.1 |
| රත්නපුර | 29 | 3.6 | 44 | 4.0 |
| කෑගල්ල | 6 | 0.7 | 20 | 1.8 |
| අනුරාධපුරය | 35 | 4.5 | 14 | 1.3 |
| පොලොන්නරුව | 7 | 0.9 | 16 | 1.5 |
| බදුල්ල | 6 | 0.7 | 19 | 1.7 |
| මොනරාගල | 10 | 1.2 | 12 | 1.1 |
| එකතුව | 800 | 100 | 1089 | 100.0 |

වගුව **- 5** මගින් පෙන්නුම් කරනුයේ රාජ්‍ය ආයතන වර්ගය අනුව **2018** වර්ෂයට සාපේක්ෂව **2019** වර්ෂයේදී රාජ්‍ය ආයතනයන්ට ලද අභියාචනා සංඛ්‍යාවයි.

වගුව **- 5** රාජ්‍ය ආයතන වර්ගය අනුව රාජ්‍ය ආයතනයන්ට ලද අභියාචනා සංඛ්‍යාව -2017 – 2019

| රාජ්‍ය ආයතන වර්ගය | 2017 | % | 2018 | % | 2019 | % |
|---|---|---|---|---|---|---|
| ජනාධිපති, අග්‍රාමාත්‍ය, පාර්ලිමේන්තුව, අමාත්‍ය මණ්ඩලය | 5 | 2.2 | 9 | 1.1 | 25 | 2.3 |
| අධිකරණ / විනිශ්චය සභා | 0 | 0.0 | 8 | 1.0 | 7 | 0.6 |
| කොමිෂන් සභා | 16 | 7.0 | 61 | 7.6 | 66 | 6.1 |
| අමාත්‍යාංශ | 28 | 12.2 | 112 | 14.0 | 170 | 15.6 |
| පළාත් සභා | 16 | 7.0 | 41 | 5.1 | 32 | 2.9 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 22 | 9.6 | 76 | 9.5 | 106 | 9.7 |
| පළාත් පාලන ආයතන | 26 | 11.3 | 60 | 7.5 | 104 | 9.6 |
| දෙපාර්තමේන්තු | 67 | 29.1 | 223 | 27.9 | 291 | 26.7 |
| ව්‍යවස්ථාපිත ආයතන | 34 | 14.8 | 134 | 16.8 | 201 | 18.5 |
| විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන | 0 | 0.0 | 31 | 3.9 | 25 | 2.3 |
| බැංකු | 16 | 7.0 | 28 | 3.5 | 24 | 2.2 |
| සමාගම් | 0 | 0.0 | 14 | 1.8 | 21 | 1.9 |
| සමූපාකාර | 0 | 0.0 | 3 | 0.4 | 12 | 1.1 |
| සමිති | 0 | 0.0 | 0 | 0.0 | 5 | 0.5 |
| එකතුව | 230 | 100 | 800 | 100 | 1089 | 100 |

**වගුව - 6 මගින් පෙන්නුම් කරන්නේ 2019 වර්ෂය තුලදී ලැබුනු අභියාචනා සංඛ්‍යාව භාෂාව අනුවය.**

වගුව - 6 **2017 - 2019 වර්ෂයන් තුලදී ලැබුනු අභියාචනා සංඛ්‍යාව භාෂාව අනුව.**

| භාෂාව | 2017 | % | 2018 | % | 2019 | % |
|---|---|---|---|---|---|---|
| සිංහල | 154 | 67.0 | 532 | 66.5 | 758 | 69.6 |
| දමිල | 23 | 10.0 | 104 | 13.0 | 156 | 14.3 |
| ඉංග්‍රීසි | 52 | 22.6 | 164 | 20.5 | 175 | 16.1 |
| | 230 | 100.0 | 800 | 100.0 | 1089 | 100.0 |

**3.2** අසන ලද අභියාචනා

**කොමිෂන් සභාවෙහි රැස්වීම්**

කොමිෂන් සභාවෙහි අභියාචනා සැසි සඳුදා සහ අඟහරුවාදා දිනයන් හි දී පවත්වනු ලැබේ.

2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 1 (3) වගන්තිය ප්‍රකාරව, පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් 2017 ජනවාරි 20 දිනැති අංක 2002 / 42 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත නියෝගය මගින් බල ගැන්වුණු, 2017 පෙබරවාරි මස 3 වන දින ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව සියලු පුරවැසියන්

සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම වෙත ප්‍රවේශ වීමේ හැකියාව ඇති විය. අදාල පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාරව, තොරතුරු සඳහා කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් තොරතුරු නිලධාරී හෝ අදාල කර්තව්‍යය පැවරුණු අභියාචනා (නම්කළ) නිලධාරියා විසින් දෙන ලද ප්‍රතිචාරය මගින් පීඩාවට පත් ඕනෑම පුරවැසියකුට නියමිත කාලච්ඡේදය ඉකුත් වීමෙන් අනතුරුව කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීම සිදු කල හැකිය.

කොමිෂන් සභාවට පනතින් පැවරුණු බලතල යටතේ අභියාචනා ඇසීමට හා විමසීම් කිරීමට බලතල පවතී. යම් පුද්ගලයකුගෙන් ඔහුගේ / ඇයගේ තත්ත්වය මත (නිදහස් කරන ලද තොරතුරු රහසාව පරීක්ෂා කරනු ඇත) සන්තකයෙහි පවත්නා යම් තොරතුරු දිවුරුමකට / සහතික කිරීමකට යටත්ව පරීක්ෂා කිරීමේ බලතල පැවතීමද මෙයට අයත් වේ. පනත මගින් මුක්ත කොට ඇති කරුණු වලින් ආවරණය කොට ඇතැයි සැලකෙන කරුණුද ඇතුළුව යම් රාජ්‍ය ආයතනයක් මගින් පවත්වාගෙන යනු ලබන ඕනෑම තොරතුරක් පරීක්ෂා කිරීමේ බලතල කොමිෂන් සභාව සතුය. යම් රාජ්‍ය ආයතනයක් විසින් (මුක්ත කිරීම් වලට යටත් කරන ලද කරුණු හැර) මහජනතාව වෙත නිදහස් නොකොට රඳවා තබාගෙන ඇති තොරතුරු යම් ආකෘතියක සැපයීමට සහ / තොරතුරු ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කිරීමට අදාල යම් ආයතනයකට උපදෙස් දීමේ හැකියාව කොමිෂන් සභාව සතුය. තොරතුරු සැපයීමේ ප්‍රමාදයක් සිදුවූ අවස්ථාවකදී යම් පුරවැසියකුගෙන් අය කරන ලද යම් මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට යම් රාජ්‍ය ආයතනයකට උපදෙස් දීමේ හැකියාවද කොමිෂන් සභාව සතුය. (15 වන වගන්තිය)

**වගුව 7 අසන ලද, අවසන් කරන ලද සහ කල් තබන ලද අභියාචනා ගණන - 2018 සහ 2019**

| වර්ෂය | අඟහරුවාදා දිනයන්හි රැස්ව අසන ලද අභියාචනා ගණන | සඳුදා දිනයන්හි රැස්ව අසන ලද අභියාචනා ගණන | කල් තබන ලද අභියාචනා | අවසන් නියෝග ලබාදුන් ගණන |
|---|---|---|---|---|
| 2018 | 455 | 345 | 251 | 549 |
| 2019 | 619 | 470 | 380 | 709 |

### 3.3 අභියාචනා ප්‍රවර්ග

වගුව - 8 මගින් පෙන්නුම් කරන්නේ අවශ්‍යතාව අනුව අභියාචනා වර්ගීකරණය කිරීමකි.

**වගුව - 8 2018 සහ 2019 වර්ෂයන්හි අවශ්‍යතාව අනුව අභියාචනා වර්ගීකරණය**

| අභියාචනා ප්‍රවර්ග | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
|---|---|---|---|---|
| තනි පුද්ගලයන් විසින් කරන ලද ඉල්ලීම් පදනම් කරගත් අභියාචනා | 537 | 65.2 | 770 | 70.7 |
| තනි පුද්ගලයන් විසින් කරන ලද එමෙන්ම පොදු අරමුණක් සඳහා වන ඉල්ලීම් පදනම් කරගත් අභියාචනා | 269 | 32.7 | 283 | 26.0 |
| පොදු අරමුණක් සඳහා සංගම් / සමිති විසින් කරන ලද ඉල්ලීම් පදනම් කරගත් අභියාචනා | 17 | 2.1 | 36 | 3.3 |
| එකතුව | 823 | 100 | 1089 | 100.0 |

අභියාචනා වලින් 70.0%ක් ම පදනම් වී ඇත්තේ පුද්ගලික ඉල්ලීම් මත වන අතර, 26.0%ක් එතෙකුදු වුවද තනි පුද්ගලයන් විසින් පොදු අරමුණක් අරභයා කරන ලද අභියාචනා ලෙස ජනිත වී ඇත. පොදු අරමුණු වෙනුවෙන්ම කරන ලද අභියාචන 2019 වර්ෂයේදී පැවතියේ 3.3% ක ප්‍රතිශතයකි.

වගුව - 9 පෙන්නුම් කරනුයේ 2017 සහ 2018ට සාපේක්ෂව තොරතුරු වර්ගීකරණය කළවිට 2019 වර්ෂයේදී ලද අභියාචනා සංඛ්‍යාවයි.

වගුව - 9 ඉල්ලුම් කරන ලද තොරතුරු අනුව වර්ගීකරණය කරන ලද අභියාචනා ප්‍රමාණය.

| තොරතුරු මූලාශ්‍රය | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| මානව සම්පත් කලමනාකරණය [පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු, විනය, විශ්‍රාම ගැනීම / ගැන්වීම ආදිය.] | 63 | 197 | 213 |
| ඉඩම් හා දේපල [ ඔප්පු, දීමනා පත්‍ර, අවසර පත්‍ර, පැවරීම්, අත්පත් කර ගැනීම්, වන්දි ගෙවීම් ආදිය] | 44 | 115 | 148 |
| පරිපාලන සහ සේවා ක්‍රියාකාරකම් [ බලපත්‍ර, සේවා ආදිය] | 37 | 124 | 203 |
| මූල්‍ය කලමනාකරණය සහ ගිණුම් [ ආදායම, වියදම, බදු ආදිය] | 17 | 47 | 54 |
| යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති [ මාර්ග, ගොඩනැගිලි, වාරිමාර්ග, ජලය ආදිය] | 16 | 28 | 86 |
| අධ්‍යාපනික සේවා [ පාසල් වලට ළමුන් ඇතුලත් කර ගැනීම, පාසල් සංවර්ධන සමිති, පාසල් පරිපාලනය] | 12 | 101 | 134 |
| පාරිසරික බලපෑම් [ පාරිසරික හායනය / අහිමි වීම් / සංරක්ෂණය ආදිය] | 11 | 16 | 15 |
| පරීක්ෂණ / විභාග, විමර්ශන කමිටු වාර්තා [විනය හැර] | 11 | 22 | 91 |
| සෞඛ්‍යය සහ විකල්ප සේවා | 6 | 19 | 34 |
| නීතිය සහ සාමය | 5 | 82 | 75 |
| ප්‍රසම්පාදන [මිලදී ගැනීම්, ඉදිකිරීම්, ටෙන්ඩර් ආදිය] | 4 | 23 | 0 |
| වෙනත් විවිධ | 4 | 26 | 30 |
| මුළු අගය | 230 | 800 | 1089 |

## 3.4. රාජ්‍ය ආයතන වල අනුගතභාවය

පනත යටතේ රාජ්‍ය ආයතන විසින් සිය රාජකාරි කටයුතු මෙහෙයවීමේදී කෙතරම් දුරට අනුගතභාවයකින් යුතුව කටයුතු කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීමටත්, සාමාන්‍ය ප්‍රතිසංස්කරණ සහ රාජ්‍ය ආයතනයට සුවිශේෂී වූ ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ සැකසීම, තොරතුරු මුදා හැරීම සඳහා රාජ්‍ය ආයතන මගින් අය කළ යුතු සාධාරණ මුදල් ප්‍රමාණයන් සම්බන්ධයෙන් උපදෙස් මාලා නිකුත් කිරීම, නොමිලයේ තොරතුරු ලබා දිය හැකි අවස්ථා සම්බන්ධයෙන් නිර්ණායක ඉදිරිපත් කිරීම, මිල ලේඛනයක් නියම කිරීම, රජයේ නිලධාරීන් සමඟ සහයෝගයෙන් යුතුව / පුහුණු වැඩසටහන් සිදු කිරීමට කටයුතු කිරීම, පනත යටතේ වන හිමිකම් හා අවශ්‍යතා සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කිරීම සහ රජයේ ආයතන මගින් නිසි පරිදි වාර්තා කලමනාකරණය සඳහා වන උපදෙස් මාලා නිකුත් කිරීම යන කටයුතු අධීක්ෂණය කිරීමේ කර්තව්‍යය කොමිෂන් සභාව සතු වේ. (14 වන වගන්තිය)

<u>විනිශ්චනය කිරීම:</u> 2017 පෙබරවාරි 03 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක වීමත් සමඟ, කොමිෂන් සභාව වෙත අභියාචනා 230ක්, 800ක් සහ 1089ක් වශයෙන් පිළිවෙළින් 2017, 2018 සහ 2019 වර්ෂයන්හි දී ලද අතර එහි එකතුව 2119ක් විය. පිළිවෙලින් අභියාචනා 208ක්, 549ක් සහ 709ක් වශයෙන් අභියාචනා 1466ක් සම්පූර්ණ ප්‍රමාණයක් 2017, 2018 සහ 2019 වර්ෂයන්හි දී පසිඳලන ලදී. 2019 වර්ෂය අවසන් වන විට පොරොත්තුව පැවති අභියාචනා ප්‍රමාණය 653ක් විය. අවසන් කරන ලද පැමිණිලි වලින් කොමිෂන් සභාවෙහි නියෝගයන්ට පටහැනිව පාර්ශව සතරක් (04) පමණක් අභියාචනාධිකරණය වෙත යොමු වන ලදී. අභියාචන අධිකාරියක් ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ගත් කළ අවසන් කරන ලද අභියාචනා ප්‍රතිශතය 69.2%ක් වීම ඉහල අගයක් යැයි සැලකිය හැකිය.

<u>බලාත්මක කිරීම</u>: 2019 අවසානය වන විට එකඟතාවට පත් නොවූ පැමිණිලි සංඛ්‍යාව 112ක් වූ අතර පසිඳලන ලද පැමිණිලි සංඛ්‍යාව 46ක ප්‍රමාණයක්ව 7.6%ක් (එකඟ නොවූ) සහ 3.1ක් (බලාත්මක කරන ලද එකඟ නොවන ලද පැමිණිලි) ලෙස ප්‍රතිශතාත්මකව පැවතිණ. රජයේ ආයතන මගින් එකඟ නොවීම පිළිබඳ නියෝග වලට අදාලව පැහැදිලි නෛතික පටිපාටියක් සමඟ බලාත්මක කිරීමේ ක්‍රමවේදයක් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව පවතී. මහේස්ත්‍රාත් අධිකරණයන්හි නඩු පැනවීමේ පටිපාටිය සම්බන්ධයෙන් සිය නෛතික විශාරදයන් හරහා කොමිෂන් සභාව විසින් අධ්‍යනය කොට ඇත.

රජයේ ආයතන අනුගත නොවීම්

වගුව 10 කොමිෂන් සභාවෙහි නීතීන්ට අනුගත නොවීම පිළිබඳ පැමිණිලි

| වර්ෂය | පැමිණිලි සංඛ්‍යාව | නඩු දැමිය හැකි මට්ටමේ පැමිණිලි | නඩු දැමිය නොහැකි මට්ටමේ පැමිණිල | ලබා දුන් තොරතුරු | පොරොත්තු |
|---|---|---|---|---|---|
| 2017 | 06 | 2 | 4 | 2 | - |
| 2018 | 49 | 9 | 31 | 5 | 4 |
| 2019 | 57 | 6 | 2 | 2 | 4 |

වාර්තා කළමනාකරණය: උපදෙස් මාලා අනුසාරයෙන් තොරතුරු කළමනාකරණය සඳහා අවශ්‍ය කෙරෙන නියමිත උපදෙස් සැපයීම.

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (7 වන වගන්තිය) ක්‍රියාත්මක වීමත් සමඟ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අසීරුතාවන්ට මුහුණ දීමට බොහෝ රාජ්‍ය ආයතන වලට සිදුව ඇත. වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පැන නැගී අසීරුතා / ගැටළු නිරාකරණය කරන ආකාරය සම්බන්ධයෙන් පියවර ගැනීමෙහි ලා කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් සාකච්ඡා වට කිහිපයක් පැවැත්විණ. උපදෙස් මාලා කෙටුම්පත් කිරීම සඳහා නීති උපදෙස් විමසා ඇත. මෙකී ක්ෂේත්‍රය කඩිනම් අවධානය යොමු කරනු පිණිස පොරොත්තුව පවතී.

ප්‍රති වාර්තාකරණ අනුගත වීම

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ අංක 8 සහ 9 වගන්ති වලින් සම්පාදනය කරනුයේ සියලු අමාත්‍යවරුන් සහ පලාත් සභාවන් හි අමාත්‍යවරුන් විසින් පනතෙහි 3 වන වගන්තියෙන් සම්පාදිත තොරතුරු වලට ප්‍රවේශ වීමේ හිමිකමට පුරවැසියන් හට ප්‍රවේශ වීමට හැකිවන පරිදි (i) ආයතනය, එහි ක්‍රියාකාරීත්වය, ක්‍රියාකාරකම් සහ රාජකාරි අදාල අමාත්‍යංශ වලට විශේෂ වන පරිදි වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා යාවත්කාල කරන ලද තොරතුරු සහිතව ද්වි වාර්ෂික වාර්තා ප්‍රකාශයට පත් කිරීමටත්, (ii) අමාත්‍යංශ වෙබ් අඩවිය පුරවැසියන්ට හිතකාමී වන ලෙස වෙන් වෙන් වශයෙන් ව්‍යාපෘති වලට අදාල තොරතුරු සන්නිවේදනය කිරීමටත් කටයුතු සම්පාදනය කිරීමටත්ය.

අමාත්‍යවරුන් විසින් නැවත ප්‍රකාශයට පත් කරනු ලබන අනුගත වීම

8 (1) වගන්තිය ප්‍රකාරව, සෑම අමාත්‍යවරයකු විසින්ම 8 (2) වගන්තියෙහි ස්ථාපිත කරන ලද තොරුතුරු විශේෂයෙන්ම අන්තර්ගත කරමින් සෑම වර්ෂයකම ජූනි මස 30 වනදාට සහ දෙසැම්බර් මස 31 වනදාට පෙර ද්වි වාර්ෂික වාර්තා ප්‍රකාශයට පත් කළ යුතු වන්නේය. 8 (3) වගන්තිය ප්‍රකාරව, පනත ක්‍රියාකාරී තලයට පැමිණ මාස සයක් ඇතුලත මෙකී වාර්තා ප්‍රකාශයට පත් කිරීම අමාත්‍යවරුන්ට අනිවාර්ය කරන ලදී. එකී වාර්තා රාජ්‍ය භාෂාවන්ගෙන් ප්‍රකාශයට පත් කළ යුතු බවට 8 (4) වගන්තිය මගින් ප්‍රතිපාදන සලසා ඇත.

අමාත්‍යවරුන් විසින් ව්‍යාපෘති වලට සම්බන්ධ තොරතුරු නැවත ප්‍රකාශයට පත් කිරීමට / සම්පාදනය කිරීමට අනුගත වීම

පනතෙහි 9 (1) (අ) ප්‍රතිපාදනය ප්‍රකාරව, සෑම අමාත්‍යවරයකු විසින්ම සාමාන්‍ය ජනතාව වෙත සහ එවන් ව්‍යාපෘති වලින් බලපෑමට ලක්විය හැකි යම් නිශ්චිත ජන කොට්ඨාශයක් / පුද්ගලයන් වෙත දැන ගැනීම පිණිස ව්‍යාපෘතියට අදාල සියලු තොරතුරු යම් ඕනෑම ව්‍යාපෘතියක් ආරම්භ වීමට මාස තුනකට පූර්වයෙන් සන්නිවේදනය කිරීම කල යුත්තේ එබඳු සන්නිවේදනයක් කරන දිනදී ම සියලු තොරතුරු ලැබෙන පරිදිය. පනතේ 9 (2) (අ) වගන්තිය ප්‍රකාරව, යම් පුරවැසියකුගේ ඉල්ලීමක් පරිදි යම් ව්‍යාපෘතියක් පිළිබ ද යාවත්කාල කළ තොරතුරු ලබා දීම අනිවාර්ය වේ. පනතෙහි 9 (3) වගන්තිය ප්‍රකාරව, දේශීයව මූල්‍යනය වන සහ විදේශීය වශයෙන් මූල්‍යනය වන ව්‍යාපෘතීන් හි අදාල අගයන්ද දැක්විය යුතුය.

අමාත්‍යවරුන්ගේ අමාත්‍යංශ විසින් ප්‍රගාමී තොරතුරු අනාවරණය කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම 8 වන වගන්තිය ප්‍රකාරව ඉතා පහල මට්ටමක පවත්නා බවත්, 9 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරුන්ගේ අමාත්‍යංශ වල ප්‍රගාමී තොරතුරු අනාවරණය කිරීම නැති තරම් වන බවත් නිරීක්ෂණය කරමින්, අදාල අවශ්‍යතාව සම්බන්ධයෙන් සියලු ලේකම්වරුන්ගේ සහ ප්‍රධාන ලේකම්වරුන්ගේ අවධානය යොමු කරවමින් චක්‍රලේඛයක් කොමිෂන් සභාව විසින් යවන ලදී. මෙම කරුණ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහාය ඇතිව ඔවුන් සඳහා කොළඹ සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයේදී ද සාකච්ඡාවට බඳුන් කරන ලදී.

### 3.5 රාජ්‍ය ආයතන මගින් වාර්තා කිරීම

තොරුතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 10 වන වගන්තිය ප්‍රකාරව “සෑම රාජ්‍ය අධිකාරියක් විසින් ම සමාලෝචිත වර්ෂය අවසන් වනවාත් සමඟම දෙසැම්බර් මස තිස් - එක් වන දිනට ප්‍රථම සිය වාර්ෂික වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. තවද ඉන් තවදුරටත් ප්‍රතිපාදනය කොට ඇත්තේ අදාල වාර්තාව සිය කාර්යාලයෙහි සහ සිය නිල වෙබ් අඩවියෙහි මහජනතාවට ප්‍රවේශ විය හැකි ආකාරයට පැවතිය යුතු වීමය. පනතෙහි ප්‍රතිපාදනයන් ප්‍රකාරව මෙකී වාර්තාව ඉදිරිපත් කිරීම අවශ්‍යයෙන්ම කළ යුත්තක් වන බවට ඇති කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු නොකොට, මෙම නෛතික අවශ්‍යතාව වෙත අවධානය යොමු කොට ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව අල්ප සංඛ්‍යාවක් වන අතර පනත බලගැන්වුණු 2017 වර්ෂයට අදාලවූ වර්තා, 2018 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වර්ෂය අවසානයේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කරන ලදී.

2017 වර්ෂයට අදාලව කොමිෂන් සභාව වෙත වාර්ෂික වාර්තා 111ක් (7.0%) ලැබී තිබූ අතර එය 2018 වර්ෂය සඳහා 219ක (13.9%) ප්‍රමාණයක් විය. මෙකී වාර්ෂික වාර්තා 219 අතරින් වාර්තා 163ක් (74.4%) අසම්පූර්ණ වූ අතර, එය වගු 11 පරිදි විය. පලාත් සභා යටතේ ආයතන 718ක් ද මධ්‍යම

රජය යටතේ ආයතන 861ක් ද වශයෙන් රාජ්‍ය අංශයේ රජයේ ආයතන 1579ක් බැව් ඇස්තමේන්තු කර ඇත.

**වගුව -11 රාජය ආයතන විසින් 2017 සහ 2018 වර්ෂයන් හි යොමු කරන ලද වාර්ෂික වාර්තා ප්‍රමාණය (10 වන වගන්තිය)**

| පලාත | 2017 | 2018 |
|---|---|---|
| බස්නාහිර | 45 | 65 |
| දකුණ | 7 | 8 |
| උතුර | 2 | 4 |
| මධ්‍යම | 24 | 23 |
| සබරගමුව | 10 | 17 |
| උතුරු මැද | 8 | 16 |
| නැගෙනහිර | 3 | 4 |
| ඌව | 6 | 33 |
| වයඹ | 6 | 3 |
| මුළු අගය | 111 | 173 |

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් සපයන ලද්දා වූ මෙහෙයුම් නිලධාරීන්ගේ සහාය ඇතිව, කොමිෂන් සභාව විසින් 2019 සැප්තැම්බර් 20 දින සියලු අමාත්‍යංශ ලේකම්වරු, ප්‍රධාන ලේකම්වරු, දිස්ත්‍රික් ලේකම්වරු යන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් යුතුව කොළඹ දී වැඩමුළුවක් පවත්වන ලදී. අදාල වැඩමුළුව සම්බන්ධයෙන් අමාත්‍යංශ ලේකම්වරු / ප්‍රධාන ලේකම්වරු වෙත චක්‍රලේඛ ලිපි යොමු කරන ලද අතර භාෂාත්‍රයෙන්ම පුවත්පත් නිවේදන නිකුත් කරන ලදී. වර්තමානය වන විට කොමිෂන් සභාව වෙත වාර්ෂික වාර්තා යොමු කිරීම ඉහල නැංවීම අරමුණු කර ගනිමින් පලාත් පාලන ආයතන සමඟ සම්බන්ධවීමේ ක්‍රියාවලියෙහි නියුතු වීමට මෙහෙයුම් නිලධාරීන් විසින් කටයුතු කරමින් සිටී.

### 3.6 මහජන දැනුම්වත්භාවය

rticommission.lk ඔස්සේ පිවිසිය හැකි කොමිෂන් සභාවෙහි ත්‍රෛ භාෂයික වෙබ් අඩවිය හරහා මහජන දැනුම්වත්භාවය ඉහල නැංවීමේ සුවිශේෂී මෙහෙවරක කොමිෂන් සභාව නියැලේ. කොමිෂන් සභාවෙහි සියලු නියෝග, එහි නීති හා රෙගුලාසි, ප්‍රතිපත්ති ප්‍රකාශන සහ උපදෙස් ඇතුලත්ව වෙබ් අඩවියෙහි සුවිශේෂී තොරතුරු ඇතුලත් කොට ඇත. ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ සහාය ලබමින්, කොමිෂන් සභාව විසින් පලාත් උපදේශන සහ අභියාචනා පසිඳලීමේ වැඩසටහන් 7ක් පානම (අම්පාර), අඹගමුව (නුවරඑළිය), කිලිනොච්චි, යාපනය, කරුවලගස්වැව (පුත්තලම), සූරියවැව (හම්බන්තොට) සහ මහියංගනය (බදුල්ල) යන ස්ථානයන්හි පවත්වන ලද්දේ සිවිල් සමාජ සංවිධාන

නායකයින්, ප්‍රජා මූලික සංවිධාන සාමාජිකයින් සහ රජයේ නිලධාරීන්ගේ සහභාගීත්වය සහිතව පවත්වන ලදී. ග්‍රාමීය දිස්ත්‍රික්කයන් හි / ප්‍රදේශයන් හි විශේෂයෙන්ම මහජන දැනුම්වත්භාවය අඩු මට්ටමක පවත්නා බැව් පලාත් උපදේශන වැඩමුළුවලදී අනාවරණය වූ කරුණක් වූයෙන්, එබඳු දැනුම්වත්භාවය ඉහල නැංවීම කොමිසමෙහි ප්‍රධාන කර්තව්‍යයක් ලෙස පවත්වා ගෙන යන ලදී.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි කොමසාරිස් කිෂාලි පින්ටො - ජයවර්ධනයන් විසින් සංස්කරණය කරන ලද "2017 – 2018 තොරුතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි තෝරාගත් නියෝග" සහ "ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීතිය සහ ක්‍රමවේදය පිළිබඳ ප්‍රත්‍යාවලෝකනය යන ග්‍රන්ථ යුගලය සිංහල, දමිල සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්ත්වයෙන්ම ප්‍රකාශයට පත් කිරීමට යෙදුණි.

ශ්‍රී ලංකාවෙහි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සහ පනතෙහි අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීමෙහිලා කොමිසමෙහි වැදගත් තීරණ සම්බන්ධයෙන් මහජනතාව වරින් වර දැනුම්වත් කිරීම පිණිස සන්නිවේදනය සහ ප්‍රකාශයන් මාධ්‍ය සමඟ සහ සබැදියාවෙන් යුතුව කටයුතු කරන ලදී.

ජාත්‍යන්තර වශයෙන්, 2019 මැයි මස 28 දින ඉතාලියේ රෝම නගරයේ දී මෙන්ම 2019 ජූනි මස 14 වන දින එක්සත් ජනපදයේ නිව්යෝක් නුවර දී ද එක්සත් ජාතීන්ගේ  අධ්‍යාපන, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO) විසින් ආරාධනා කරන ලදුව සත්කාරකත්වය සපයන ලද, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක 2030 න්‍යාය පත්‍රය සම්බන්ධ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සහ ඒ හා සබැඳි අභියෝග යන මැයෙන් ආරාධිත දේශනය කිරීම සඳහා කොමිෂන් සභාවෙහි කොමසාරිස් කිෂාලි පින්ටො - ජයවර්ධනයන් නියෝජනය කරන ලදී. ස්කොට්ලන්තයේ තොරතුරු නිදහස පිළිබඳ කොමසාරිස්වරයා සමඟ කොමිෂන් සභාවෙහි කොමසාරිස් කිෂාලි පින්ටො - ජයවර්ධනයන් විසින් 2019 දෙසැම්බර් 14 දිනට යෙදුණු පිලිපීන ජනරජයේ තොරතුරු දැනගැනීමේ විධායක නිදහසෙහි තෙවන වර්ෂය සම්බන්ධයෙන් උත්සවයේ ආරාධිත දේශනයේදී සාකච්ඡා කරන ලදී.

# 4. පරිපාලනය සහ මූල්‍ය කාර්යසාධනය

## 4.1 ආධාර ආයතනයන් හි තාක්ෂණික සහ මූල්‍ය සහාය

### එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) ව්‍යාපෘති

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් ආරම්භයේ සිටම අභියාචනා විශ්ලේශනය කිරීමෙහි ලා අවැසි වන්නා වූ එමෙන්ම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි මානයන් සකස් කිරීමෙහි ලා පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය වන්නා වූ නෛතික ලියවිලි සකස් කිරීම වෙනුවෙන් ද සිය නෛතික විශේෂඥතාව සපයන ලදී. අධ්‍යතන නෛතික පර්යේෂණවලින් අනතුරුව නෛතික ලියවිලි සකසන ලද්දා වූ ජ්‍යෙෂ්ඨ නෛතික පර්යේෂණ උපදේශකයන් සහ කණිෂ්ඨ නෛතික පර්යේෂණ උපදේශකයන් මෙන්ම කොමිෂන් සභාවෙහි උපදේශකත්වයෙන් කෙටුම්පත් කරන ලද්දා වූ අවසන් නියෝග ස්ථාපිත කරන ලද්දේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) සහාය ලබා ගනිමිනි.
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් පනතෙහි 10 වන වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව වෙත පොදු අධිකාරී ආයතනයන් (PAs) සම්බන්ධයෙන් වූ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම මෙහෙයවීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සමුද්දේශයික විෂය (term of reference) සහිතව මෙහෙයුම් නිලධාරියකු සහ සහකාර මෙහෙයුම් නිලධාරියකු පත් කරන ලදී. ඔවුන් එකී සේවයෙහි නියුතුව සිටින ලද කාලය 2019 අප්‍රේල් සිට සැප්තැම්බර් මස දක්වා විය.

### ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය මගින් සහාය සලසනු ලබන ව්‍යාපෘතිය

ගැටුම් වලින් බලපෑමට ලක් වූ සහ කොන් වූ ප්‍රජාවන්ට තොරතුරු දැන ගැනීමේ සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, කිෂාලි පින්ටෝ - ජයවර්ධනයන් විසින් සංස්කරණය කරන ලද පළමු වෙළුම - 2017 සිට 2018 දක්වා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි තෝරාගත් නියෝග සහ දෙවන වෙළුම - ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම සහ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පාලනය සම්බන්ධයෙන් වූ පසු විපරම් යන මැයෙන් යුත් වෙළුම දෙකක් 2018 මැයි මස 1 දින සිට 2019 අගෝස්තු 30 දින දක්වා කාලය තුළදී ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයෙන් ලද මූල්‍ය සහායෙන් රුපියල් මිලියන 10.124ක මුදලකින් එළිදක්වන ලදී. තවද ව්‍යාපෘතිය යටතේ එකඟතාවය පැමිණි තෝරාගත් දිස්ත්‍රික්ක 12 හි කොන් වූ ප්‍රජාවන් සහ තොරතුරු නිලධාරීන් සඳහා පලාත් උපදේශන අවස්ථා සහ අභියාචනා සම්බන්ධයෙන් පසිඳලීමෙහි නියුතු වීම් සතකට අවතීර්ණ වන ලදී. එකී දිස්ත්‍රික්කයන් වනුයේ ත්‍රිකුණාමලය සහ මඩකලපුව (එකක්), බදුල්ල සහ මොනරාගල (එකක්), නුවරඑළිය සහ මහනුවර (එකක්), කිලිනොච්චි සහ මුලතිවු (එකක්), යාපනය සහ වවුනියාව (එකක්) වශයෙනි - එක් වැඩමුළුවකට 40 දෙනෙකුගේ සහභාගීත්වයක් සහිත විය.

### යහ පාලනය සහ වගවීම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SDGAP- USAID)

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පනත යටතේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරෙන අභියාචනාවන්ට අදාල මූලික වැඩ කටයුතු සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය සහාය ලබා දීම පිණිස නෛතික පර්යේෂකයන් වෙත සහාය ලබා දීම, මෙන්ම වැඩිවන අභියාචනා සම්බන්ධයෙන් අවධානය යොමු කරමින්

අභියාචනා ඇසීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ද වඩාත් කඩිනමින් පුරවැසියන් වෙත අභියාචනාවන්හි තත්ත්වය සම්බන්ධයෙන් වූ තොරතුරු ලබා දීමේ අභිප්‍රායෙන් ද යුතුව අභියාචනා වල පිළිවෙල පවත්වාගෙන යාමට මෙන්ම අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කරගෙන යාමේදී එකී අභියාචනා සම්බන්ධයෙන් පසු විපරමක් පවත්වා ගැනීමේ අරමුණින් යුතුව කටයුතු කිරීම අත්‍යවශය වීම මත වෙබ් අඩවිය මත පදනම් වූ ඉලෙක්ට්‍රොනික විපරම් පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුත්තෙහි යහ පාලනය සහ වගවීම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SDGAP) නියුතු වන ලදී. යහ පාලනය සහ වගවීම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SDGAP) විසින් හදිසි ඇමුතුම් සේවාවක් සහ වෙබ් පාදක විපරම් පද්ධතියක් මගින් පහසුකම් සැලසීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු භාර ගන්නා ලදී.

## 4.2 කොමිෂන් සභාවෙහි කාර්ය මණ්ඩලය

### වගුව 12 අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 01 | 01 |
| පර්යේෂණ නිලධාරී | 01 | 01 |
| පරිපාලන නිලධාරී | 01 | 01 |
| මූල්‍ය නිලධාරී | 01 | 01 |
| භාෂා පරිවර්තක (දමිල) | 01 | - |
| තොරතුරු තාක්ෂණ සහකාර | 01 | 01 |
| සංවර්ධන නිලධාරී | 04 | 04 |
| කලමනාකරණ සහකාර | 04 | 04 |
| පෞද්ගලික සහකාර | 01 | - |
| රියදුරු | 03 | 02 |
| කාර්යාල කාර්ය සහායක | 02 | 01 |
| සම්පූර්ණ සේවක සංඛ්‍යාව | 21 | 17 |

## 4.3 අයවැය සහ මූල්‍ය පාලනය

**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව (RTI Commission)**

වියදම් වාර්තාව - 2019

| අයිතමය | අයවැය ප්‍රතිපාදන | මුළු වියදම | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| | | | |
| පුනරාවර්තන වියදම් | 40,000,000.00 | 32,869,650.83 | 82.17 |
| ප්‍රාග්ධන වියදම් | 4,500,000.00 | 4,133,215.38 | 91.85 |
| | | | |
| ස්විට්සර්ලන්ත ව්‍යාපෘතිය | 4,560,000.00 | 4,560,000.00 | 100.00 |